# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1197/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 20/07/2024
පැය 1135

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.07.19 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 86 | - | තඹ දඟර 02<br>ප්ලාස්ටික් බූලි 02<br>යකඩ බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාශය**

2024.07.19 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි නිලධාරීන් කණ්ඩායමක් විසින් මට්ටක්කුලිය පොලිස් වසමේ සමිත්පුර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 270 ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 44 ක් වූ සමිත්පුර ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.** මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.07.19 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හෙට්ටිපොල පොලිස් වසමේ නුගවෙල හංදිය දී වැටලීමක් සිදු කර තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද දුම්වැටි 700 ක් හා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හෙට්ටිපොල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ අරණායක ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** හෙට්ටිපොල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. ගංජා සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර.**

2024.07.19 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අරලගංවිල පොලිස් වසමේ යාය 06 ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර ගංජා ග්‍රෑම් 400 ක් අඩංගු පාර්සලයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අරලගංවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ** යාය 06 **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය කඳවුර**

2024.07.19 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය නිලධාරීන් කණ්ඩායමක් විසින් දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ සරණගම වෙල්යාය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් ග්‍රෑම් 8 මිලි ග්‍රෑම් 140 ක් හා ත්‍රීරෝද රථයක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ** හෙනානිගල **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**